**කොවිඩ්-19 සති පාසල**

**10 ශ්‍රේණිය**

**4.3 සංස්කෘතිය (අධ්‍යාපනය,සාහිත්‍ය සහ රසාස්වාදය,වාර්ගික සහජීවනය)**

- ශ්‍රී ලාංකික ශිෂ්ටාචාරයේ ආරම්භයේ දී අධ්‍යාපනය පරම්පරාවෙන් පරම්පරාවට දැනුම හුවමාරු කිරීමේ ක්‍රමවේදයක් ලෙස පැවති අතර පසුකාලීනව ක්‍රමානුකූල අධ්‍යාපන ක්‍රමයක් ආරම්භ විය.
- බුදු දහම මුල්බැස ගැනීමත් සමග බෞද්ධ විහාර ආරාම ප්‍රධාන අධ්‍යාපන මධ්‍යස්ථානය වූ අතර බෞද්ධ භික්ෂූන් වහන්සේලා මුල් පෙලේ ගුරුවරු ලෙස කටයුතු කළහ.
- රජරට ශිස්ටාචාර සමයේ දී පාලි,සංස්කෘත,සහ සිංහල යන භාෂා ත්‍රිත්වයෙන්ම සාහිත්‍ය කෘති ලියැවී ඇති අතර සීගිරි කැටපත් පවුරේ ඇති කුරුටු ගී මතගින් ද එකල සාහිත්‍ය රසාස්වාදය පිළිබඳව තොරතුරු රැසක් අනාවරණය වෙයි.
- ඈත අතීතයේ සිටම මෙරට තුළ විවිධ සංස්කෘතීන්ට අයත් විවිධ ජාතීහු සහජීවනයෙන් යුතුව වාසය කර තිබේ.වෙළෙඳාම, ආගමික කටයුතු, පරිපාලන කටයුතු, විවාහ කටයුතු ආදියේ දී එම සහජීවනය මැනවින් දක්නට ලැබුණි.

**ක්‍රියාකාරකම්**

1. අතීතයේ මෙරට අධ්‍යාපනය ලබා දුන් ගුරුවරුන් කිහිපදෙනෙක් සඳහන් කරන්න.
2. පැරණි ලංකාවේ පැවති දියුණු අධ්‍යාපන මධ්‍යස්ථාන කිහිපයක් නම් කරන්න.
3. රජරට ශිෂ්ටාචාර සමයේ ලියැවුණු පාලි, සංස්කෘත සහ සිංහල ග්‍රන්ථ සඳහා උදාහරණ වෙන වෙනම ලියන්න.
4. අතීතයේ සිට මෙරට සමාජයේ සිටි විදේශීය ජාතීන් සඳහා උදාහරණ සපයන්න.
5. විවිධ ජාතීහු අතීතයේ සිටම මෙරට තුළ සහජීවනයෙන් යුතුව කටයුතු කළ බව උදාහරණ තුනක් ඔස්සේ විස්තර කරන්න.

M P A KUMARA - KITHALANGAMUWA K.V.